ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

## මාධ්‍ය නිව**ේදනය**

**ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ට ඉන්දියානු වීසා නිකුත් කිරීම සම්බන්ධයෙන් වන මාධ්‍ය විමසීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම**

සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා කඩිනමින් සහ සුමට අයුරින් වීසා නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම අපගේ ස්ථාවර ප්‍රතිපත්තිය වේ. ශ්‍රී ලංකාව ඉන්දියාවේ සංචාරය කිරීම සඳහා පුරවැසියන්ට ඉ-වීසා (E-visa) පහසුකම ලබා ගත හැකි රටක් ද වේ. කෙසේ වෙතත්, මහ කොමසාරිස් කාර්යාලයෙන් වීසා අයදුම් කිරීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික පුරවැසියන් මාර්ගගත ක්‍රමය (online) හරහා වීසා අයදුම් කර කොළඹ, මහනුවර, යාපනය, හම්බන්තොට සහ මඩකලපුව යන ප්‍රදේශවල පිහිටා තිබෙන ඉන්දියානු කොන්සියුලර් සේවා අයදුම් කිරීමේ මධ්‍යස්ථානයකට තම අයදුම්පත් භාර දිය යුතුය.

2. බෞද්ධ සිද්ධස්ථාන ඇතුළුව වන්දනා චාරිකා සඳහා ඉන්දියාවට සංචාරය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා වීසා කඩිනමින් නිකුත් කරනු ලැබේ. මෙම අයදුම්පත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් නිර්දේශ කර තිබේ නම්, වන්දනාකරුවන් 10ක් හෝ ඊට වැඩි කණ්ඩායම් සඳහා හැකි සෑම අවස්ථාවකම වීසා ගාස්තුවකින් තොරව වීසා නිකුත් කරනු ලැබේ. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සඳහා සේවා සැපයූ නියෝජිතායතනය වෙනස් කිරීම හේතුවෙන් කෙටි කාලයකට මෙම ක්‍රියාවලිය නතර කරන ලදී. නව සේවා සම්පාදකයකු තෝරා ගැනීමෙන් අනතුරුව එම ආයතනය 2026 ජූලි 7 වන දින සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර වන්දනා චාරිකා සඳහා ඉන්දියාවට යන ශ්‍රී ලාංකිකයන් සඳහා වීසා ගාස්තු රහිතව වීසා නිකුත් කිරීම යළි හඳුන්වාදෙන ලදී. කලින් සිදු කළ පරිදි මෙම ඉල්ලීම් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කළ යුතු වේ. 10 දෙනෙකු හෝ ඊට වැඩි කණ්ඩායම් වශයෙන් මෙම වීසා අයදුම් කළ යුතු අතර ඔවුන්ගේ ජෛවමිතික දත්ත ලබා දීම සඳහා අයදුම්කරුවන් තමන්ට පහසු පරිදි තනි තනිව හෝ කණ්ඩායමක් වශයෙන් ඉන්දියානු කොන්සියුලර් සේවා අයදුම් කිරීමේ මධ්‍යස්ථානයකට පැමිණිය යුතුය. මෙය ඉන්දීය රජයේ නව රෙගුලාසි යටතේ අනිවාර්ය අවශ්‍යතාවයකි. කෙසේ වෙතත්, ජෛව මිතික දත්ත ලබා දිය යුත්තේ වයස අවුරුදු 12-70 අතර අයදුම්කරුවන් පමණි.

3. ජෛව මිතික දත්ත ලබා දීම සඳහා ඉන්දියානු කොන්සියුලර් සේවා අයදුම් කිරීමේ මධ්‍යස්ථාන වෙත පැමිණෙන අනෙකුත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ

අවස්ථාවක් ලබා දී කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කර දෙනු ලබයි. ජෛව මිතික දත්ත ලබා ගැනීමෙන් ඉන්දියාවට පිවිසීමේදී ඉන්දීය ආගමන කටයුතු සුමටව සහ පහසුවෙන් සිදු කර ගත හැකි වන බව සහතික කරනු ඇත.

4. එබැවින් ඉහත පරිදි වීසා අයදුම්පත් යොමු කරන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගෙන් වීසා ගාස්තුවක් අය නොකෙරේ. ඒ අනුව ශ්‍රී ලංකා වන්දනාකරුවන් සඳහා වීසා ගාස්තුවේ කිසිදු වෙනසක් පිළිබඳ ප්‍රශ්නයක් මතු නොවේ. කෙසේ වෙතත්, අයදුම්කරුවන් ශ්‍රී ලංකා රුපියල් 1855/-ක වීසා සේවා ගාස්තු වශයෙන් වීසා අයදුම් කිරීමේ මධ්‍යස්ථානයට ගෙවිය යුතුය.

*කොළඹ*
*2026 ජූලි 24*